## පොළොන්නරුව දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 13 - 2023

--------------------------------------------------------------------------------

## 1. විගණන මතය

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 13 ක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 13 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 13 හි කාරක සභා 02 ක මතය ව්‍යාවනය කර, කාරක සභා 11 ක තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණ අතර, ඒ සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

### 1.1 මූල්‍ය ප්‍රකාශන

#### 1.1.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 09 ක් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව මූල්‍ය ප්‍රකාශනවල එක් එක් දේපළ, පිරියත හා උපකරණ පංතිය සම්බන්ධයෙන් ඒවායේ පිරිවැය, ප්‍රයෝජනවත් ජීව කාලය, කාලච්ඡේදය ආරම්භයේ සහ අවසානයේ සමුච්චිත ක්ෂය මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි. | නිවැරදි කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | කාරක සභා 03 ක් විසින් ගොඩනැගිලි, යන්ත්‍ර, උපකරණ හා වාහන මූලික වටිනාකම මත ක්ෂය කර ගිණුම්ගත කර ඇති බව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණද, ඒවායේ ශුද්ධ වටිනාකම මත ක්ෂය කර ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කළ යුතුය. |
| (ඇ) | කාරක සභා 12 ක් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව රු.11,895,312 ක් වටිනා දේපළ, පිරියත හා උපකරණ අයිතම 27 ක් අත්පත් කරගැනීම මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. | නිවැරදි කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | කාරක සභා 08 ක් විසින් වෙනත් පාර්ශවයන් වෙතින් ලැබී තිබූ වත්කම් අයිතම 18 ක පිරිවැය හඳුනාගැනීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ | මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාව විසින් කාබනික | - එම - |

| | | | |
|---|---|---|---|
| | ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි අවශ්‍යතාවයන් සලකා අත්පත් කරගත් දිනට එහි සාධාරණ අගය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පොහොර අමුද්‍රව්‍ය කැබලි කිරීමේ යන්ත්‍රය වෙනත් පාර්ශවයකට බැහැර කර ඇති බව සහ අනෙකුත් ගොවිජන සේවා කාරක සභාවලට පිරිවැය හඳුනාගත නොහැකි වී ඇති බව. | |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 9 අනුව තොග සම්බන්ධ අලාභයන් එම අලාභයන් සිදුවන කාලච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගත යුතු වුවත්, කාරක සභා 04 ක පෙර වර්ෂවලදී හානියට පත් වූ, කල් ඉකුත් වූ හා තාක්ෂණික වශයෙන් කල් ඉකුත් වී තිබූ පිරිවැය රු.1,067,886 ක් වටිනා තොග සම්බන්ධයෙන් ඒ පරිදි ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව | - එම - |
| (ඊ) | කාරක සභා 02 ක් විසින් වත්කම් භාවිතා කිරීමට ඉඩ ඇතැයි අපේක්ෂිත කාලපරිච්ඡේදය නැවත සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් ක්‍රියාකාරී භාවිතයේ පැවතුණු එකතු පිරිවැය රු.171,597 ක් වූ දේපළ, පිරියත හා උපකරණ සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව | වත්කම් භාවිතා කිරීමට ඉඩ ඇතැයි අපේක්ෂිත කාලච්ඡේදය නැවත සමාලෝචනය කළ යුතුය. |
| (උ) | ගොවි බැංකු 11 ක් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 මඟින් දක්වා ඇති පරිදි මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියලුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා පසුගිය කාලච්ඡේදයේ සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති ආකෘතිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |
| (ඌ) | කාරක සභා 11 ක් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 මඟින් ඉදිරිපත් කර තිබූ යෝග්‍ය ආකෘති අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති ආකෘතිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

### 1.1.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 03 ක් විසින් ගොවිජන සේවා කාරක සභාවලට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කර නොතිබුණි. | නිවැරදි කරන බව | වත්කම් ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | කාරක සභා 08 ක් විසින් විකුණා මුදල් ගෙවීමේ පදනම මත කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් වෙත යවන ලද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඔවුන් අතැතිව පැවති රු.9,021,705 ක විකුණුම් වටිනාකමක් සහිත තොගය මූල්‍ය ප්‍රකාශනවල විකුණුම් ලෙස හඳුනාගෙන තිබුණි. | ණයට විකුණුම් ලෙස ගිණුම්ගත කර ඇති බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මඟින් විස්තර කර ඇති කොන්දේසි අනුව භාණ්ඩ විකිණීමෙන් වන අයභාරය හඳුනාගැනීම කළ යුතුය. |
| (ඇ) | කාරක සභා 05 ක් විසින් සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොලී ආදායම් රු.296,339 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදි කරන බව | කාලපරිච්ඡේදයට අදාල ගනුදෙනු සම්පූර්ණයෙන්ම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | කාරක සභා 04 ක් විසින් සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොලිය රු.475,736 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදි කරන බව | - එම - |
| (ඉ) | කාරක සභා 06 ක් විසින් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු.806,755 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදි කරන බව | - එම - |
| (ඊ) | ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් සමාලෝචිත වර්ෂයේ ආරම්භයට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.562,072 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදි කරන බව | කාලපරිච්ඡේදයට අදාල ගනුදෙනු සම්පූර්ණයෙන්ම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | කාරක සභා 02 ක් විසින් සමාලෝචිත වර්ෂයේදී දේපළ, පිරියත හා උපකරණ ක්ෂය ගණනය කිරීම රු.213,688 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කරන බව | - එම - |
| (ඌ) | බකමූණ ගොවිජන සේවා කාරක සභාව විසින් ස්ථාවර තැන්පතු 02 කට අදාලව එම ගිණුම් ආරම්භ කළ දින සිට සමාලෝචිත වර්ෂයේ කල් | නිවැරදි කරන බව | - එම - |

| | | | |
|---|---|---|---|
| | පිරෙන දින දක්වා පොලී ආදායම වූ රු.536,580 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබුණි. | | |
| (එ) | බකමූණ ගොවිජන සේවා කාරක සභාව විසින් නවනගරය ගොවිජන සේවා කාරක සභාව වෙත ලබාදී, එහි මූල්‍ය ප්‍රකාශනවලද ඇතුළත් කර තිබූ රු.1,090,085 ක් වූ ට්‍රැක්ටර් රථයේ වටිනාකම තවදුරටත් බකමූණ ගොවිජන සේවා කාරක සභා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදි කරන බව | විධිමත් පරිදි අයිතිය පවරා නිසි අනුමැතිය මත ගිණුම්වල ගැලපීම් කර නිවැරදි කළ යුතුය. |
| (ඒ) | පුලස්තිගම ගොවිජන සේවා කාරක සභාවේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ එකතු වටිනාකම රු.4,174,986 ක ලැබීම් මුදල් ප්‍රවාහයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ නිරූපණය කර තිබුණි. | නිවැරදි කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |
| (ඔ) | කාරක සභා 03 ක ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ රු.1,084,502 ක් වූ ලැබීම් මුදල් ප්‍රවාහ සහ රු.1,500,000 ක ගෙවීම් මුදල් ප්‍රවාහ, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ නිරූපණය කර තිබුණි. | නිවැරදි කරන බව | - එම - |
| (ඕ) | සේවාගම ගොවිජන සේවා කාරක සභාව විසින් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු පරිගණක යන්ත්‍ර අත්පත් කරගැනීම සඳහා වැය කර තිබූ රු.650,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | නිවැරදි කරන බව | - එම - |
| (ක) | කාරක සභා 04 ක පෙර වර්ෂවලට අදාළව සමාලෝචිත වර්ෂය තුළදී ලැබුණු පොහොර පරිහරණ මුදල් රු.6,342,508 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. | නිවැරදි කරන බව | කාලපරිච්ඡේදයට අදාල ගනුදෙනු විධිමත්ව හඳුනාගෙන නිසි පරිදි ගිණුම්ගත කළ යුතුය. |
| (ග) | කාරක සභා 03 ක් විසින් ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,950,000 ක් වැයකර මිලදී ගෙන තිබුණු පරිගණක උපාංග 06 ක ගැනුම් මිල සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය මඟින් ලබාදුන් වාචික උපදෙස් මත ගිණුම්ගත කළ බව | ගොවිජන සේවා කාරක සභාවේ වත්කම් වැඩිවීමක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඝ) | ගොවි බැංකු 07 ක සමාලෝචිත වර්ෂයට අදාල පොලී ආදායම් රු.470,194 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කරන බව | උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ච) සේවාගම ගොවි බැංකු නියමු ව්‍යාපෘතියේ ගිණුම් කාලච්ඡේදය ආරම්භයට ලැබිය යුතු ණය පොලී ආදායම රු.310,522 ක් වැඩියෙන් ද, කාලච්ඡේදය අවසානයට ලැබිය යුතු ණය පොලී ආදායම රු.351,245 ක් අඩුවෙන් ද ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කරන බව | - එම - |
| (ජ) ගොවි බැංකු නියමු ව්‍යාපෘති 07 ක ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ රු.30,701,647 ක මුදල් ප්‍රවාහයන් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ රු.5,298,472 ක ගෙවීම් මුදල් ප්‍රවාහයන් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේද දක්වා තිබුණි. | නිවැරදි කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ට) ගොවි බැංකු නියමු ව්‍යාපෘති 04 ක මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ රු.83,485,392 ක ශුද්ධ මුදල් ප්‍රවාහයන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන් ලෙස දක්වා තිබුණි. | නිවැරදි කරන බව | - එම - |
| (ඩ) ගොවි බැංකු නියමු ව්‍යාපෘති 03 ක මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ රු.2,644,989 ක ලැබීම් මුදල් ප්‍රවාහයන් හා මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ රු.2,051,248 ක ගෙවීම් මුදල් ප්‍රවාහයන් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේද දක්වා තිබුණි. | නිවැරදි කරන බව | - එම - |
| (ණ) ගොවි බැංකු නියමු ව්‍යාපෘති 02 ක මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ රු.10,297,200 ක ලැබීම් මුදල් ප්‍රවාහයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | නිවැරදි කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ත) මනම්පිටිය ගොවි බැංකුව වෙත ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ රු.265,470 ක් ලැබීම්, මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වන මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි කරන බව | - එම - |

### 1.1.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 02 ක ලෙජර් ගිණුම් 06 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා | නිවැරදි කිරීමට කටයුතු කරන බව | සැසඳීම් සිදුකර නිවැරදි ලෙස |

| | |
|---|---|
| අනුරූපී වාර්තා අනුව ශේෂය අතර එකතු වටිනාකම රු.6,672,145 ක නොසැසඳීමක් විය. | ගිණුම්ගත කළ යුතුවේ. |

### 1.1.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා 03 ක් විසින් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.30,558,267 ක් වූ ගෙවීම් වවුචර් 317 ක් සඳහා සහතික කිරීමේ නිලධාරියා විසින් සහතික කිරීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණි. | නිවැරදි කරන බව | මුදල් රෙගුලාසි 245(1) හා 257 අනුව කටයුතු කළ යුතුය. |

### 1.1.5 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 12 කට අදාළව ගිණුම් විෂයයන් 50 ක් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතු වටිනාකම රු.197,652,593 ක් සඳහා ශේෂ සනාථන, ස්ථාවර වත්කම් ලේඛන, කුවිතාන්සි බිල්පත්, කාල විශ්ලේෂණ හා ආදායම් ලේඛන නොමැතිවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස පරික්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගනුදෙනු සහ ශේෂ පරික්ෂා කිරීම සඳහා අදාළ සාක්ෂි විගණනයට ලබාදිය යුතුය. |
| (ආ) | මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාවේ දෛනික ගෙවීම් ලේඛනයේ සඳහන් රු.8,333,055 ක් වූ ගෙවීම සඳහා වවුචර් 40 ක් විගණනය වෙත ඉදිරිපත් නොවිය. | අඩුපාඩු සකස් කිරීමට කටයුතු කරන බව | අදාළ ගෙවීම් සිදුවූ බව සනාථ කරගැනීමට අවශ්‍ය සාක්ෂි ලෙස ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | | |
| (i) 52(1) වගන්තිය | කාරක සභා 10 ක් විසින් බල ප්‍රදේශය සඳහා කෘෂිකාර්මික වැඩසටහනක් පිළියල කර නොතිබුණි. | කාරක සභා 04 ක ක්‍රියාකාරි සැලැස්මේ අන්තර්ගත බව සහ කාරක සභා 03 ක් ඉදිරියේදී කටයුතු කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ii) 54(1) වගන්තිය | කාරක සභා 08 ක් විසින් ඉඩම්හිමි ගොවියන් සහ ඉඩම් භුක්තිකරුවන් විසින් තම කෘෂිකර්ම ඉඩම් පිළිබඳ හා සභාව විසින් සඳහන් කරනු ලැබිය හැකි යම් කාලපරිච්ඡේදයක් ඇතුළත කරගෙන ගිය කෘෂිකාර්මික ඉඩම් කටයුතු පිළිබඳ තොරතුරු ලියවිල්ලක් මගින් දැනුවත් කර නොතිබුණි. | කාරක සභා 04 ක් විසින් ඉදිරියේදී දැනුවත් කිරීමට කටයුතු කරන බව සහ එක් කාරක සභාවකට ප්‍රායෝගිකව කළ නොහැකි බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (iii) 54(2),(3),(4),(5) වගන්ති | කාරක සභා 08 ක් විසින් ඉහත වගකීම ඉටු නොකරන ලද ඉඩම් හිමි ගොවීන් සහ ඉඩම් භුක්තිකරුවන් සම්බන්ධයෙන් පනතේ යොමුගත වගන්තිවල විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව | - එම - |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 105 | හිඟුරක්ගොඩ ගොවිජන සේවා කාරක සභාවේ 2021 වර්ෂයේදී සාවද්‍ය තොරතුරු ඇතුළත් වවුචර්පත් | අදාළ නිලධාරියා වෙත ලිඛිත උපදෙස් ලබාදී ඇති බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | | සකස් කර ගොඩනැගිලි අලුත්වැඩියා කටයුත්තක් සඳහා රු.146,000 ක් වැඩිපුර ගෙවීම් කර තිබීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 133,134(3) | ගොවිජන සේවා කාරක සභා 05 ක මුදල් හා ගනුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සිදුකළ යුතු බව | - එම - |
| | (iii) මුදල් රෙගුලාසි 214 | කාරක සභා 12 ක් විසින් බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | නිවැරදි කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ** | | | |
| | (i) 2006 දෙසැම්බර් 14 දිනැති අංක 2006/08 දරන චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 109 හා 756 | කාරක සභා 03 ක් විසින් රු.714,795 ක් වටිනා කල් ඉකුත් වූ පොහොර හා කෘෂි රසායන ලියාහැරීම සම්බන්ධයෙන් චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. | ගොවිජන සහකාර කොමසාරිස් දැනුවත් කර ඇති බව | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) ගොවිජන සේවා කොමසාරිස්ගේ 2014 දෙසැම්බර් 31 දිනැති අංක 10/2014 දරන චක්‍රලේඛය | • චක්‍රලේඛයේ උපදෙස් පරිදි ගොවිජන සංවර්ධන නිලධාරී හා මධ්‍යස්ථාන ලිපිකරුවන් විසින් තොග පොත් පරීක්ෂා කිරීම හා අවම වශයෙන් මාසයකට වරක්වත් භෞතිකව තොග පරීක්ෂාවක් සිදු කළ යුතු බව දක්වා තිබුණද, ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් ඒ පරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| • මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාව විසින් අනියම් පදනමින් සේවය කිරීම සඳහා බඳවාගෙන අලෙවි සැලේ මුදල් හා තොග හැසිරවීම සිදුකරනු ලබන සේවකයින් දෙදෙනෙකු සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විධිමත්ව රාජකාරි පැවරීම හා සුදුසු පරිදි පත්වීමේ ලිපියක් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැන්පතු ලබාගෙන ඇති බව | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2023 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 13හි එකතුව රු.36,636,062 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක සභා 12 ක අතිරික්තය හා සභාවක ඌනතාවය පිළිවෙලින් රු.17,660,759 ක් හා රු.25,945ක් විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල අනුව ගොවිජන බැංකු 13හි එකතුව රු.17,834,524ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.12,572,499 ක් විය.

### 2.2 විශ්ලේෂණාත්මක සමාලෝචනය

යූරියා පොහොර විකුණුම් ආදායම් හා ස්ථාවර තැන්පතු පොලී ආදායම් වැඩිවීම, පොහොර වියදම් ප්‍රතිපූර්ණය වීම කාරක සභා 13 හි අතිරික්තයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපදෙස් පරිදි, කාරක සභා 06 ක නිලධාරීන් සේවා ස්ථානයට පැමිණීම හා පිටවීමේ වේලාවන් ඇඟිලි සලකුණු කිරීමේ යන්ත්‍ර මඟින් සටහන් කර නොතිබුණි. | ඇඟිලි සලකුණු කිරීමේ යන්ත්‍රය ක්‍රියා විරහිත වී ඇති බව | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | අඹගස්වැව ගොවිජන සේවා කාරක සභාවේ රු.24,323 ක් වටිනා වායු රයිෆලයක් පෙර සිටි ප්‍රාදේශීය නිලධාරිවරයා රැගෙන ගොස් ඇතත්, අදාළ උපකරණය ආපසු ලබාගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | අදාළ නිලධාරියා දැනුවත් කර ඇති බව | අදාළ උපකරණය නැවත ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | කාරක සභා 05 ක ස්ථාවර තැන්පතු පොලී ආදායම මත සමාලෝචිත වර්ෂයේදී බැංකුව විසින් අයකරගෙන තිබුණු රු.272,345 ක බදු මුදල 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත 70 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ පාර්ශව දැනුවත් කර ඇති බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | බකමූණ ගොවිජන සේවා කාරක සභාවේ නිලධාරීන් 06 දෙනෙකු වෙත 2012 වර්ෂයේ සිට නිකුත් කර තිබුණු කුවිතාන්සි පොත් 24 ක් නැවත කාරක සභාව වෙත ආපසු භාරගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2011 පෙබරවාරි 01 දිනැති අංක 1/2011 චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාවේ 2023 ජනවාරි මස සිට අප්‍රේල් මස දක්වා කාලයට අදාළව අලෙවි සහකරු විසින් අතින් පිළියෙල කළ දෛනික තොග නිකුත් කිරීමේ ලේඛන, 2023 ජනවාරි 01 දින සිට ජුනි 01 දක්වා කාලයට අදාළව බැංකුගත කළ මුදල්වලට අදාළ බැංකු ලදුපත් සහ ඊට අදාළ කුවිතාන්සි, එම කාලය තුළ ගොවිජන සේවා කාරක සභාවේ කම්ටු ලිපිකරු වශයෙන් කටයුතු කළ නිලධාරියා භාරයේ පැවතියදී අස්ථානගත වී තිබීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ දෙවන උපලේඛනයේ දැක්වෙන රජයේ නිලධාරියෙකුගේ අතින් සිදුවිය හැකි වරදක් සිදුවී ඇත්ද යන්න පරීක්ෂා කර නොතිබුණි. | නිලධාරියාගෙන් නිදහසට කරුණු විමසා ගොවිජන සහකාර කොමසාරිස් වෙත යොමුකර ඇති බව | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | ගොවිජන සේවා කාරක සභා 04 ක ඉඩම් ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරාගෙන නොතිබුණි. | ඉදිරි කටයුතු සිදුකරන බව | ඉඩම් පවරාගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (උ) | ගිරිතලේ ගොවිජන සේවා කාරක සභාව විසින් 2021 යල වගා කන්නය සඳහා ක්‍රියාත්මක කළ අස්වනු මිලදීගැනීමේ රජයේ කඩිනම් වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමේදී කාරක සභාවේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරිනියන් දෙදෙනෙකු විසින් රු.715,000 ක් ගොවීන්ගෙන් අයථා ලෙස ලබාගෙන ඇති බවට තොරතුරු | අදහස් දක්වා නැත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 13 වන ඡේදය පරිදි කටයුතු කර නොතිබුණි. | | |
| (ඌ) | පොහොර තොග අවභාවිත කිරීම හේතුවෙන් කාරක සභා 02 ක සේවයේ යෙදී සිටි කම්ටු ලිපිකාරිණීන් විසින් ඒ සඳහා ගෙවිය යුතු රු.148,099 ක මුදල අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ) | ගොවි බැංකු නියමු ව්‍යාපෘති 03 ක 2001 සිට 2011 දක්වා කාලය තුළ ගොවීන් 78 දෙනෙකු වෙත නිකුත් කර තිබූ රු.768,964 ක ණය සම්බන්ධයෙන් වූ ගිවිසුම් අස්ථානගත වී තිබුණි. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයා ගේ උපදෙස් මත ඉදිරි කටයුතු සිදුකරන බව | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2012 පෙබරවාරි 29 දිනැති අංක 4/2012 චක්‍රලේඛයේ 3.4.7 (II) පරිදි කටයුතු කළ යුතුය. |
| (ඒ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 13 ක් විසින් රු.90,512,754 ක් වූ හිඟ ණය ශේෂ 2277 ක් අයකර ගැනීමට පරීක්ෂණ පවත්වා ඇති ණයකරුවන් සංඛ්‍යාව 645 ක් බවත් විනිශ්චය සභාව වෙත යොමුකර ඇති ණයකරුවන් සංඛ්‍යාව 446 ක් බවත්, ඉන් අධිකරණ ක්‍රියාමාර්ග අරඹා ඇති ණයකරුවන් සංඛ්‍යා 41 ක් බවත් විගණනයට අනාවරණය විය. | අයකර ගැනීමට කටයුතු කරන බව | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2012 පෙබරවාරි 29 දිනැති අංක 4/2012 දරන චක්‍රලේඛයේ පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | ගොවිජන බැංකු 07 ක අක්‍රිය කුඩා කණ්ඩායම් සංඛ්‍යාව 850 ක් විය. | සක්‍රීයව පවත්වා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව | කුඩා කණ්ඩායම් සක්‍රීයව පවත්වා ගත යුතුය. |
| (ඕ) | වැලිකන්ද ගොවි බැංකු නියමු ව්‍යාපෘතියේ එකතු වටිනාකම රු.13,572,111 ක් වූ කොටස් මුදල්, සාමාන්‍ය තැන්පත් මුදල්, ළමා ඉතුරුම් ගොවි සංවිධාන හා කුඩා කණ්ඩායම් තැන්පත් මුදල් සඳහා සුදුසු ආකෘති ප්‍රකාරව ලෙජරයන් හස්ත ක්‍රමයට (Manual Method) යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි | ඉදිරියේදී කටයුතු කරන බව | ලෙජරයන් යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

**3.2** මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාවේ 2023 ජනවාරි සිට අගෝස්තු මස දක්වා කාලය තුළ එකතු වන මුළු අලෙවි ආදායමෙන් බැංකුගත නොකර අත රඳවාගෙන තිබුණු මුදල රු.794,152 ක් වී තිබුණි. කාරක සභාවේ හා අලෙවි අංශයට අදාළ වියදම්, අලෙවි සහකරු මඟින් සිදුකරවාගත් බවට තොරතුරු ඉදිරිපත් කළ අතර, එසේ දරන ලද රු.645,646 ක් සඳහා බලයලත් නිලධාරීන් විසින් අනුමත කරන ලද වවුචර්පත් හෝ මුදල් ලද බවට ආදායකයාගෙන් ලබාගත් කුවිතාන්සි හෝ ගෙවීම් නිවැරදි බවට තහවුරු කරගත හැකි කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණු අතර, ඉතිරි රු.148,506 ක මුදල සම්බන්ධව කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවීය. | ගෙවීම් වවුචර් පිළියෙල කර ඉදිරිපත් කර ඇති බව | විධිමත් පරීක්ෂාවක් සිදුකර අවභාවිතාවක් සිදු වී ඇත්නම් නීත්‍යානුකූලව කටයුතු කිරීමත්, මුදල් ගනුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට වැඩපිළිවෙලක් යෙදීමත් කළ යුතුය. |
| (ආ) | රජයේ ඕනෑම නිලධාරියෙකුට රජය වෙනුවෙන් මුදලක් ලැබුණු වහාම කුවිතාන්සියක් නිකුත් කළ යුතු බව මුදල් රෙගුලාසි 168 මඟින් අවධාරණය කර තිබියදී, මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාවේ අලෙවිසැල මඟින් 2023 මැයි 28 සිට 2023 ජූලි 07 දක්වා කාලය තුළ ගොවීන් වෙත කුවිතාන්සි නිකුත් කිරීමකින් තොරව අලෙවි කටයුතු සිදුකර මාස 10 කට පසුව සාවද්‍ය ලෙස රු.16,514,631 ක වටිනාකමින් යුතු කුවිතාන්සි පිළියෙල කර තිබුණි. | කුවිතාන්සි පිළියෙල කර දෛනික ලේඛන සකස් කර ඇති බව | - එම - |
| (ඇ) | මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාවේ අලෙවි සහකරු විසින් දින අවසානයේදී බැංකුගත කළ මුදල් සඳහා ලබාගත් බැංකු ලදුපත මධ්‍යස්ථාන ලිපිකරු වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ සඳහා කුවිතාන්සි නිකුත් කර දෛනික මුදල් ලැබීම් ලේඛනයක ගිණුම්ගත කිරීම හා එසේ සිදුකළ බවට අධීක්ෂණ නිලධාරියා විසින් සහතික විය යුතු නමුත් අවස්ථා 08 ක දී බැංකුගත කරන ලද රු.17,685,707 ක් සඳහා කුවිතාන්සි නොමැතිව දෛනික ලැබීම් ලේඛනවල සටහන් කර තිබුණි. | නිවැරදි කරන බව | - එම - |

| | | |
|---|---|---|
| (ඇ) මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාව විසින් සිදුකර තිබුණු රු.345,087,635 ක ගෙවීම් නිවැරදි බවට තහවුරු කරගැනීම පිණිස වවුචරයේ සඳහන් දළ මුදල ලද බවට ආදායකයාගෙන් ලබාගත් කුවිතාන්සි හා ගබඩා සැපයුම් සඳහා වන ගෙවීම්වලදී භාණ්ඩ ලැබී ඇති බවට අදාළ බඩු ලේඛණ හෝ තොග පොත්වල ඇතුළත් කර ඇති බවට සහතික විගණනයට ඉදිරිපත් නොවීය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | විධිමත් පරීක්ෂාවක් සිදුකර අවභාවිතාවක් සිදු වී ඇත්නම් නීත්‍යානුකූලව කටයුතු කිරීමත්, මුදල් ගනුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට වැඩපිළිවෙලක් යෙදීමත් කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 09 ක වත්කම් අයිතම 53 ක් නිෂ්කාර්යව පැවතුණු අතර, ඒවායින් අයිතම 39 ක වටිනාකම රු.4,154,944 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | සුදුසු කටයුතු සිදු කරන බව දන්වා ඇත. | සම්පත් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීමේදී ප්‍රසම්පාදන අස්ථිත්වයන් විසින් පිලිපැදිය යුතු කාර්යපටිපාටි අනුගමනය කිරීමකින් තොරව ගොවිජන සේවා කාරක සභා 02 ක් විසින් 2023 වර්ෂය තුළදී රු.411,725 ක් වටිනා මිලදී ගැනීම් සිදුකර තිබුණි. | නිවැරදි කරන බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |
| (ආ) බකමූණ ගොවිජන සේවා කාරක සභාව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 වගන්තිය මඟින් විස්තර කර ඇති පරිදි ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු පත් කර නොතිබුණි. | නිවැරදි කරන බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |